සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 44 S

නම ...............................................

නැටුම් I කොටස

කාලය පැය දෙකයි

උපදෙස් : සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු සපයන්න.
  - 1 - 5 දක්වා අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. තා තෙයි තා තෙයියත් තා යනු
    1. 4 වන පා සරඹයයි. 2. දෙවන පා සරඹයයි.
    3. හත්වනපා සරඹයයි. 4. 5 වන පා සරඹයයි.

02. නම්‍යතා අභ්‍යාස කිරීම ඉතා වැදගත් වන්නේ,
    1. නිවැරදි පාද හැසිරවීම සඳහාය. 2. නර්තනයට අවශ්‍ය පරිදි ශරීරාංග හැඩගස්වා ගැනීමටය.
    3. නිවැරදි අංගහාර සකස්කර ගැනීමටය. 4. නර්තනයේ දී ප්‍රාසාංගික බව වැඩිකර ගැනීමටය.

03. මැදුම් තනිතිතට අයත් බෙර පදයකි
    1. ජිංගත ගොගො 2. දොම්කිත කිත දොම් 3. කුඳගත ගත දොං 4. දොදොංත තකු දොං

04.“හිසමුව තුළ බෙල්ල දෙවුර දැතෝ‍ දකුගිලි අගිනේ ” යන කවි පදය අයත් වන්නේ,
    1. සවරං කවි වලටය. 2. සිරසපාද කවි වලටය.
    2. පතුරු කවි වලටය. 4. තාලම් කවි වලටය.

05. රුංතක ජිංතක තරිකිට කුංදත් තාග් ගජිංතක තරිකිට කුන්දත් රුංතක ජිංතක තරිකිට කුංදත් තා මෙම කස්තිරම
    1. ඇල සරඹයේ කස්තිරම වේ. 2. තුන් අඩියේ කස්තිරම වේ.
    3. දැල සරඹයේ කස්තිරම වේ. 4. අංගහාර සරඹයේ කස්තිරම වේ.

- 6-10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.
  ( අනාඝාතාත්මකව , මැණ්ඩිය, සාමූහික කවි, තුන , පා සරඹ)

06.නර්තනයේමූලික ඉරියව්ව .......................... වේ.

07.හමාර පදය නටනු ලබන්නේ ......................... අවසානයේ දී ය.

08.දෙතිතේ තාල රූප ........................ කි.

09.පැල් කවි ..................................... ගායනා කරන කවි විශේෂයකි.

10. ......................................... ගැමි නැටුම් වල දැකිය හැකි ලක්ෂණයකි.

- 11-15 දක්වා ඇති වචන වලින් නොගැළපෙන වචන තෝරා යටින් ඉරක් අඳින්න.

11. ගැට බෙරය, දෙවොල් බෙරය, දවුල, දඩු බෙරය

12. කුළු, සවරං, තාලම්, වන්නම්, පතුරු

13. හම්බන්තොට, උඩු නුවර, හේවාහැට, හාරිස්පත්තුව

14. තානම, දණ්ඩි සරඹ, බෙර පදය, කවිය, කස්තිරම

15. සමගුණ, දෙගුණ සිව්ගුණ, මධ්‍ය ලය

● **16-20 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. විශාල ශබ්දයක් ඇසීමෙන් 'භය' නමැති ස්ථායී භාවය ඉස්මතු වේ. ( )

17. ගොඩ සරඹ අවසානයේ කස්තිරම පදය නටනු ලබයි. ( )

18. තුරඟා වන්නම මාත්‍රා 2+ 3 තාලයට අයත් වේ. ( )

19. වන්නම් නර්තනයේ දීඅලංකාර පද යොදා ගැනීම ඉතා වැදගත් වේ. ( )

20. ගැට බෙරයේ දිග එක් වියත් තුනගුලකි. ( )

# II කොටස

● **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පන්ති කාමරයේ දී සිසුන් තිදෙනෙක් විසින් නිරූපණය කළ සත්ව චරිත පිළිබඳ ප්‍රකාශ පහත දැක්වේ. එය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

දිලිනි - මොණරා ඉතා ආඩම්භරයි. මම එය ඉදිරිපත් කළේ බෙල්ල, හිස, නිකට භාවිතා කරමින්.

කමනි - සිංහයාගේ භයානක පෙනුම තමයි මට ඉස්මතු කරන්න ඕනෙ. මම ඒ සඳහා අංග, ප්‍රත්‍යංග උපාංග

යන කොටස් වලට'භය' නමැති ස්ථායීභාවය යොදා ගත්තා.

පවනි - ඔය දෙදෙනාටම වඩා මට ඇත්තෙ තියුණු ඇස් දෙකක්, උකුස්සාගේ චරිතය මම අංග, ප්‍රත්‍යංග උපාංග මගින් ඉදිරිපත් කළා.

i. කමනි ඉදිරිපත් කළ චරිතය කුමක් ද? එහි භාවය නම් කරන්න. (ල. 03)
ii. දිලිනි ඉදිරිපත් කළ චරිතය කුමක් ද? එම චරිතයේ සඳහන් අංග , ප්‍රත්‍යංග, උපාංග නම් කරන්න. (ල. 03)
iii. උකුස්සාගේ භාවය නිරූපණය කිරීමට පවනි ඇගේ ශරීරයේ කුමන කොටස් යොදා ගත්තේද? (ල. 04)

(02) නර්තනය, ගායනය මෙන්ම වාදනය ද තාලය මත රඳා පවතී.
i. දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 03)
ii. මාත්‍රා 2+3 තාලයට අයත් බෙර පදයක්ප්‍රස්තාර කරන්න. (ල. 03)
iii. මාත්‍රා 3තාලයට අයත් කවියක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

(03) දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයේම වන්නම් දක්නට ලැබේ.
i. උඩරට වන්නමක කොටස් නම් කරන්න. (ල. 03)
ii. උඩරට හා සබරගමවු වන්නම් ගණනින් කීයද? (ල. 03)
iii. වන්නම් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 04)

(04) ගැමි ජනයාගේ ජීවන රටාව ගැමි නැටුම් මගින් පිළිඹිබු වේ.
i. වෘත්තිය ගැමි නැටුම් 3 ක් නම් කරන්න. (ල. 03)
ii. ඉන් එක් ගැමි නැටුමක ගායනයක් ලියන්න. (ල. 03)
iii. ගැමි නැටුමක දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 04)

(05) පහත සඳහන් පාරිභාෂිත වචන අතරින් 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
i. නම්‍යතා අභ්‍යාස ii. ගොඩ සරඹ iii. මණ්ඩිය iv. දවුල (ල. 5 x2 )

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**පළමු වාර පරීක්ෂණය - 2019**

08 ශ්‍රේණිය නර්තනය

පිළිතුරු පත්‍රය

# I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 6 - මණ්ඩිය | 11 - දවුබෙරය | 16 - ✓ |
| 2 - 2 | 7 - පා සරඹ | 12 - වන්නම් | 17 - ✓ |
| 3 - 1 | 8 - තුන | 13 - හම්බන්තොට | 18 - ✓ |
| 4 - 2 | 9 - අනාඝාතාත්මක | 14 - දණ්ඩි සරඹ | 19 - ✓ |
| 5 - 1 | 10 - සාමූහික බව | 15 - මධ්‍ය ලය | 20 - ✗ |

(ලකුණු 1x 20)

## <u>II කොටස</u>

(01) I. චරිතය - සිංහයා (ල. 01)
භාවය - භය (ල. 02)

ii. චරිතය - මොණරා
අංග - හිස
ප්‍රත්‍යංගය - බෙල්ල
උපාංග - නිකට (ල. 03)

iii. හිස, ඇස්, බෙල්ල, දෑත, ඇඟිලි, දෙපා යනාදී සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න. ( ල. 04)

(02) i. සුළු මැදුම් දෙතිත, සුළු මහ දෙතිත, මැදුම් මහ දෙතිත (ල. 03)

ii.

| ∧ | | / | | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දොං | _ | ජිං | _ | ත | ග | ත | දොං | _ | ත |

(ල. 03)

iii. මාත්‍රා 3 තාලයට ගැලපෙන කවියක් ප්‍රස්ථාර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

(03) i. බෙරපදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව (ල. 03)

ii. උඩරට - 18 සබරගමු- 21 (ල. 03)

iii. සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ල. 04)

(04) I. කුළු, ගොයම්, මෝල්ගස් (ල. 03)

ii. වෘත්තියට අදාළව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

iii. සරල බව, සාමූහිකබව, එමකම, උපකරණ භාවිතය (ල. 04)

(05) මාතෘකාවට අදාළව කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 5x2 )